සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා
**චක්‍රලේඛ ලිපි අංක 25 /2024**

මගේ අංකය: PPSC/ES/14/FI/06/3-2
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
සබරගමුව පළාත් සභා සංකීර්ණය
නව නගරය - රත්නපුර
2024.08.12

ලේකම්
පළාත් මාර්ග සංවර්ධන,ග්‍රාමීය යටිතල පහසුකම්
සංචාරක ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව

**සබරගමුව පළාත් රාජ්‍ය සේවයෙහි පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ - තාක්ෂණ තනතුර සඳහා වන පළමු වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය -2024 ඔක්තෝම්බර්/නොවැම්බර්**

සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ **විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ - තාක්ෂණ තනතුරේ** සේවය කරන නිලධාරීගෙන් උක්ත විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම චක්‍රලේඛ ලිපිය සබරගමුව පළාතේ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ - තාක්ෂණ තනතුරේ සේවය කරන නිලධාරියාගේ **දැනගැනීම සඳහා වහාම යොමු කරන්න.** අයදුම්කරු ඉදිරිපත්ව නොමැති නම් විභාගයේ ඉදිරි කටයුතු කිරීමට ප්‍රථමයෙන් ඒ පිළිබඳව ද කඩිනමින් මා දැනුවත් කරන මෙන් කාරුණිකව දන්වමි. **මෙම චක්‍රලේඛය හා අයදුම්පත්‍රය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ** www.psc.sg.gov.lk හා සබරගමුව පළාත් වෙබ් අඩවියට www.sg.gov.lk යොමු කර ඇත.

02. බඳවා ගැනීමේ පරිපාටියට අනුව මෙම විභාගයේ විෂය නිර්දේශය පහත සඳහන් පරිදි වේ.

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| **ක්‍රීඩා පනත** | ක්‍රීඩා පනත ආශ්‍රයෙන් සකස් කරනු ලබන අර්ධ ව්‍යුහගත අභියෝගතා ප්‍රශ්න පත්‍රයකි. | පැය 03 | 100 | 40 |
| මුදල් රෙගුලාසි | ශ්‍රී ලංකාවේ මූල්‍ය පාලනය:<br>1.රාජ්‍ය මූල්‍ය සම්බන්ධ පාර්ලිමේන්තු පාලනය<br>2.ඒකාබද්ධ අරමුදල හා එහි ක්‍රියාකාරීත්වය<br>3.විසර්ජනයේ අරමුණු හා විසර්ජන ක්‍රම<br>4.අවිනිශ්චිත අවස්ථා අරමුදල<br>5.භාණ්ඩාගාරයේ බලතල හා කාර්යභාරය<br>6.විගණකාධිපති,ඔහුගේ බලතල හා කර්යභාරය<br>7.රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව(COPA)<br>8.පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) | පැය 02 | 100 | 40 |
| පරිපාලනය | 1.ක්ෂේත්‍ර කටයුතු සංවිධානය කිරීම හා සංවිධාන ක්‍රම<br>2.ආයතනයේ සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද: I,II,III,V,VI,VII,IX,XI,XII,XXIII,XXV,XXVI,XXVII,XXVIII,XXIX,XXX,XXXI,XXXII,XXXIII,XLVII හා XLVIII<br>3.රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීති<br>4.කාර්යාල කළමනාකරණය | පැය 02 | 100 | 40 |

*සටහන:-* **සාමාර්ථය සඳහා එක් විෂයකට 40%කට නොඅඩු ලකුණු සංඛ්‍යාවක් ලබා ගත යුතුය.**

03. **විභාගයට අයදුම්කිරීම -** අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු ය. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අයදුම්කරු ස්වකීය අයදුම්පත්‍රය පිළියෙල කර ගත යුතු අතර, ඒ අනුව පිළියෙළ කරන ලද අයදුම්පත්‍ර අපේක්ෂකයා විසින් සිය පෞද්ගලික ලිපි ගොනුව නඩත්තු කරන කාර්යාලයේ / දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් **2024.09.15** දින හෝ ඊට පෙර සබරගමුව පළාත් ක්‍රීඩා අමාත්‍යාංශ ලේකම් මගින් මා වෙත ලැබෙන සේ යොමු කල යුතු ය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අදාළ තොරතුරු සම්පූර්ණ කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. විභාගයට පෙනී සිටීම සඳහා අයදුම්කරුට පවත්වන දිනය, ස්ථානය හා වේලාව **විභාග ප්‍රවේශ පත්‍ර** මගින් යථා කාලයේ දී දැනුම් දෙනු ලැබේ.

05. මෙම විභාග නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කරුණක් පිළිබඳව සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

ඊ.කේ.ඒ.සුනීතා
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

ඊ.කේ.ඒ. සුනීතා
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

<u>පිටපත්</u>

1. ප්‍රධාන ලේකම්, සබරගමුව පළාත් සභාව - කාරුණික දැනගැනීම සඳහා
2. පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ,ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව,ස.ප.ස-අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

ආදර්ශ අයදුම්පත්‍රය

**සබරගමුව පළාත් රාජ්‍ය සේවයෙහි පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ - තාක්ෂණ තනතුර සඳහා වන පළමු වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය -2024 ඔක්තෝම්බර්/නොවැම්බර්**

01. (a) මුලකුරු සමඟ නම:-
.............................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
(b) සම්පූර්ණ නම :-
.............................................................................................................................
(c) මුලකුරු සමඟ නම :-
.............................................................................................................................
(d) රාජකාරී ලිපිනය:-
.............................................................................................................................
(මෙම ලිපිනයට ප්‍රවේශ පත්‍ර තැපැල් කරනු ලැබේ.)
(e) ස්ත්‍රී / පුරුෂ භාවය:-..........................................................................
(f) දුරකථන අංකය පෞද්ගලික:- ..........................................................................
(g) දුරකථන අංකය රාජකාරී :- ..........................................................................
(i) පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට පෙනී සිටින වාර ගණන-..........................................

02. ජාතික හැඳුනුම්පත් අංකය:-

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

03. උපන් දිනය:- වර්ෂය [ ] මාසය [ ] දිනය [ ]

04. ඔබ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ - තාක්ෂණ තනතුර ශ්‍රේණියට පත් වූ දිනය:-.........................................................................

05. විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත භාෂා මාධ්‍යය - සිංහල/දෙමළ

06. පෙනී සිටීමට අපේක්ෂිත විෂයයන් :- 01..........................................................
02..........................................................
03..........................................................

07. ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන නීති රීතිවලට යටත්වන බව ද ප්‍රකාශ කරමි.

දිනය:-

.......................................................
(අපේක්ෂකයාගේ/ අපේක්ෂිකාවගේ අත්සන)

---

ඉහත නම් සඳහන් අපේක්ෂකයා ඉදිරිපත් කර ඇති තොරතුරු පෞද්ගලික ලිපිගොනුව අනුව සත්‍ය/අසත්‍ය බව නිර්දේශ කරමි.(නිර්දේශ නොකරන්නේ නම් හේතු දක්වන්න.)

.......................................................

දිනය :-

දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ
අත්සන හා පදවි නාමය
(කරුණාකර නිල මුද්‍රාව තබන්න.)

---

ඉහත නම් සඳහන් අපේක්ෂකයාට මෙම විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ඇති/නැති බව නිර්දේශ කරමි. (නිර්දේශ නොකරන්නේ නම් හේතු දක්වන්න.)

.......................................................

දිනය :-

ලේකම්/ලේකම් වෙනුවට
ක්‍රීඩා අමාත්‍යාංශය
ස.ප.ස
(කරුණාකර නිල මුද්‍රාව තබන්න.)